# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක : 21 /2017

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2017 දෙසැම්බර් මස 21 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>2017 සේවක සංඛ්‍යා සමාලෝචන වාර්තා සමඟ අනුගමනය කළ යුතු උපදෙස්</u>**

2017.11.09 වැනි දින පවත්වන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 975 වන සභා වාරයේදී, 2017 සේවක සංඛ්‍යා සමාලෝචන වාර්තා සලකා බලමින්, ලිපිකරු හා සමාන්තර සහ ප්‍රාථමික මට්ටමේ ශ්‍රේණිවල දැනට සේවයේ නියුතු සේවකයන්ට අදාළ බඳවා ගැනීමේ පරිපාටිවල අවශ්‍යතාවන්ට අනුව කටයුතු කිරීම පිණිස, උසස් අධ්‍යාපන ආයතන/ආයතනවලට පහත දැක්වෙන උපදෙස් නිකුත් කිරීමට තීරණය කරන ලදී;

1. ලිපිකරු, පරිගණක යෙදුම් සහකාර,යතුරු ලේඛක සහ ළඝු ලේඛක යන තනතුරුවල සේවය කරන්නන්, කළමනාකරණ සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කරන තුරු හා කළමනාකරණ සහකාර තනතුරේ ශ්‍රේණිගත උසස් කිරීම්වල කටයුතු අවසන් කරන තෙක් ඉහත සඳහන් කළ තනතුරුවල සේවය කරන්නන් සඳහා දැනට ක්‍රියාත්මක බඳවා ගැනීමේ පරිපාටි/(උසස් වීම් ක්‍රමවේද) අනුගමනය කළ යුතුය. එසේම, එම විධිවිධානයන්ම පොත් තබන්නා, ගබඩා භාරකරු සහ සරප් යන තනතුරුවල නියුතු සේවකයන්ට පිළිවෙලින් කළමනාකරණ සහකාර(පොත් තබන්නා), කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) සහ කළමනාකරණ සහකාර(සරප්) තනතුරුවලට අන්තර්ග්‍රහණය කිරීම කරන තුරු හා කළමනාකරණ සහකාර(පොත් තබන්නා), කළමනාකරණ සහකාර(ගබඩා භාරකරු) සහ කළමනාකරණ සහකාර (සරප්) යන තනතුරුවල ශ්‍රේණිගත උසස් කිරීම් කටයුතු අවසන් කරන තෙක් අදාළ වේ.
2. කම්කරු තනතුරෙහි සේවය කරන්නන්, වැඩ සහායක තනතුරට පත් කර ගැනීම හා වැඩ සහායක තනතුරේ ශ්‍රේණිගත උසස් කිරීම් කටයුතු අවසන් කරන තෙක් එකී තනතුරෙහි සේවය කරන්නන් සඳහා දැනට පවතින බඳවා ගැනීමේ පරිපාටි/(උසස් වීම් ක්‍රමවේද) අනුගමනය කළ යුතුවේ .
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිසි අනුමැතියකින් තොරව බඳවා ගැනීමේ පරිපාටිවල දක්වා ඇති සුදුසුකම් සංශෝධනය නොකළ යුතුය.

4. 2017 සේවක සංඛ්‍යා සමාලෝචන වාර්තාවල “ශ්‍රේණිය/පන්තිය” යන නමින් සඳහන් තීරුව, ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යථාකාලයේදී නියමිත උපදෙස් නිකුත් කරන තෙක් සලකා නොබැලිය යුතුය.

5. 2017 සේවක සංඛ්‍යා සමාලෝචන වාර්තා මගින් හඳුන්වාදුන් නව තනතුරු හා වැටුප් කේතයන්, අන්තර්ග්‍රහණ කටයුතු සිදු කරන තෙක්, 2017 සේවක සංඛ්‍යා සමාලෝචන වාර්තා නිකුත් කිරීමෙන් පසුව බඳවා ගත් සේවකයන් සඳහා පමණක් අනුගමනය කළ යුතු වේ .

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

මහාචාර්ය පී.එස්.එම්.ගුණරත්න
උප සභාපති

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මුල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරීවරුන් / සහකාර මුල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවලනියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූ.ජී.සී./එච්.ආර්/2/3/01

T/-